යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපලේ නාම පුවරුවේ පළමුවෙන් දමිළ බසින් සහ දෙවෙනුව සිංහල බසින් එහි නම සඳහන් වීම, පසුගිය දින වලදී බොහෝ සෙයින් සාකච්ඡාවට බඳුන් විණි. මේ සම්බන්ධයෙන් වාර්තා කරනා දිවයින පුවත්පත සිරස්තලය ලෙසින් යොදාගන්නේ "යාපනේදී සිංහල බස දෙකට වැටෙයි" යනුවෙනි. බැලූ බැල්මට මෙම පුවතේ සහ සිරස්තලයේ කරුණු සඳහන් කිරීමක් විනා, වරදක් සඳහන් කොට නැතැයි යමෙකු තර්ක කළ හැකි වුවත්, උක්ත කරුණ සම්බන්ධයෙන් පැතිර ගිය අදහස් සමගින් ගත් විට මෙම සිරස්තලය තුළ සැඟවුණු ස්වරය සම්බන්ධයෙන් නැවත සලකා බැලීමට සිදුවේ.
කෙසේ වෙතත් මෙම පුවතේ සඳහන් නොවන කරුණක්ද වේ. එනම් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැක්වෙන ආකාරයට, රජයේ ආයතන විසින් පොදු වාර්තා තබාගැනීම සඳහා සහ සියලු කටයුතු ඉටු කිරීම සඳහා දෙමළ භාෂාව භාවිතා කරනා උතුරු හා නැගෙනහිර පළාත් හැර ශ්‍රී ලංකාවේ සියලුම පළාත් වල පරිපාලන භාෂාව සිංහල විය යුතු බවට සඳහන් වන බවයි. එසේම යටකී පළාත් වල එසේ දමිළ බස පළමුව සහ සිංහල බස දෙවනුව සඳහන් කිරීමේ භාවිතාව අරුමයක්ද නොවේ.
මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

**#MediaethicsSL #SinhalaPress #lka #Divaina**